# ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව
# ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය – අම්පාර
# 2019 මැයි මාසය

**01.** රැස්වීම පැවැත්වූ ස්ථානය - නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

**02.** පැවැත් වූ දිනය - 2019 .05.09

**03.** රැස්විමේ ප්‍රධානත්වය - නේවාසික ව්‍යාපෘති කළමණාකරු

**04.** සහභාගිත්වය

## 4. 1 රජයේ නිලධාරින්

| අ: අ: | නම | තනතුර | බල ප්‍රදේශය |
|---|---|---|---|
| 01. | ඊ.ක්‍රිස්ටි දේශප්‍රිය මයා | නේවාසික ව්‍යාපෘති කළමණාකරු | ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය |
| 02. | ඒ.ලියනගේ මයා | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | අම්පාර |
| 03. | ජී.නිමන්ති නිශ්ශංක මිය | ගොවිජන සේවා ප්‍රදේශීය නිළධාරි | උහන |
| 04. | සජිත් ආරියසේන මයා | කෘෂිකර්ම උපදේශක( බීජ හා රෝපන) | අම්පාර |
| 05. | එච්.එම්.ඩී. පී. සංජීව මයා | ගොවිජන සේවා ප්‍රදේශීය නිළධාරි | මධ්‍යම කඳවුර |
| 06. | එම්.ඒ.සි.එන්.රත්නායක මයා | ගොවිජන සේවා ප්‍රදේශීය නිළධාරි | නාමල්තලාව |
| 07. | කේ.එස්.ජී.සිරිසේන මයා | ගොවිජන සේවා ප්‍රදේශීය නිළධාරි | මායාදුන්න |
| 08. | කේ.එස්.කේ.හේරත් මිය | සංවර්ධන සහකාර | ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය |
| 09. | එම්.එච්.එෆ.නුෂ්හා මිය | සංවර්ධන නිළධාරි | ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය |
| 10. | ඒ.එල්.අස්මියා බේගම් මිය | සංවර්ධන නිළධාරි | ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය |
| 11. | වි .රම්මියා මිය | සංවර්ධන නිළධාරි | ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය |
| 12. | එන්.ටී.ආර්. ජයවීර මයා | ඉංජිනේරු සහකාර | උහන |
| 13. | ආර්.එම්.එස්.රත්නායක මයා | ඉංජිනේරු සහකාර | ගොනාගොල්ල ඒකකය |
| 14. | ජේ.ඒ.ඩී.එස්.සේනාරත්න මයා | ඉංජිනේරු සහකාර | අම්පාර |
| 15. | එම්.එන්.සලිතා මිය | සංවර්ධන නිළධාරි | ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය |
| 16. | ඩබ්.එම්.ඒ.බී. විජේසුන්දර මයා | ඉංජිනේරු සහකාර | වීරගොඩ |

## 4. 2 ගොවි නියෝජිතයින්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01. | ඩබ්ලිව්.එස්.කේ.ජයවර්ධන මයා | ගරු භාණ්ඩාගාරික | එල්.බි.19 |
| 02. | වයි.පී.ගුණසේකර මයා | ගරු සභාපති | එම්. 08 |
| 03. | ටී.ජී.ප්‍රේමරත්න මයා | ගරු සභාපති | යූ.බි.3,4,5,6 |
| 04. | ආර්.එම්.ටිකිරිබංඩා මයා | ගරු සභාපති | යූ.බි.01 |

| | | | |
|---|---|---|---|
| 05. | කේ.එම්.සුරවීර මයා | ගරු සභාපති | එල්.බී.12 |
| 06. | එන්.එම්.ජයසේකර මයා | ගරු භාණ්ඩාගාරික | එල්.බී.12 |
| 07. | ඊ.එම්.ගුණතිලක මයා | ගරු භාණ්ඩාගාරික | එල්.බී.14 |
| 08. | බී.එම්.විජේරත්න මයා | ගරු සභාපති | යූ.බී.02 |
| 09. | එම්.එම්.මුතුබංඩා මයා | ගරු සභාපති | එල්.බී.20 |
| 10. | බී.ජී. ජයසිංහ මයා | ගරු භාණ්ඩාගාරික | යූ.බී.3,4,5,6 |
| 11. | ආර්.එම්.රම්බංඩා මයා | ගරු ලේකම් | එම්.5/4 |
| 12. | ඒ.වී. ගුණරත්න මයා | ගරු සභාපති | එල්.බී.40,41.42 |
| 13. | එම්.එම්.මහින්දපාල මයා | ගරු සභාපති | එල්.බී.21/22 |
| 14. | කේ.ජේ.කේ.මැණිකේ මිය | ගරු භාණ්ඩාගාරික | එම්.16/18 |
| 15. | පී.එම්.ප්‍රියන්ත මයා | ගරු භාණ්ඩාගාරික | ජී.9/12 |
| 16. | ඩබ්ලිව්.ජී. කරුණාදාස මයා | ගරු භාණ්ඩාගාරික | ජී.6 |
| 17. | ඩබ්ලිව්.එම්.චන්ද්‍රපාල මයා | ගරු ලේකම් | යූ.බී 01 |
| 18. | ඒ.සිරිසේන මයා | ගරු සභාපති | එම්.01 |
| 19. | එච්.එම්.ප්‍රේමරත්න මයා | ගරු සභාපති | එල්.බී.2,3 |
| 20. | එම්.ඒ.සමන් චන්ද්‍රසිරි මයා | ගරු භාණ්ඩාගාරික | එම්.01 |
| 21. | එච්.ආර්.වික්‍රමතිලක මයා | ගරු භාණ්ඩාගාරික | යූ.බී.17 |
| 22. | යූ.ආර්.දයානන්ද මයා | ගරු සභාපති | යූ.බී.17 |
| 23. | පී.එම්.ජයවර්ධන මයා | ගරු භාණ්ඩාගාරික | එල්.බී.08 |
| 24. | එච්.එම්. ටිකිරිබංඩා මයා | ගරු ලේකම් | යූ.බී.09 |
| 25. | ආර්.කරුණාරත්න මයා | ගරු සභාපති | යූ.බී.09 |
| 26. | ඒ.එම්.ජයසිංහ මයා | ගරු භාණ්ඩාගාරික | එම්.5.2 |
| 27. | ඩබ්ලිව්.ඒ.ප්‍රසන්න කුමාර මයා | ගරු සභාපති | ජී.13.14.16 |
| 28. | ඒ.පී.ජයවංශ මයා | ගරු ලේකම් | යූ.බී.07 |
| 29. | ඩබ්ලිව්.සෝමරත්න මයා | ගරු භාණ්ඩාගාරික | එම්.2,3,4 |
| 30. | එල්.ජී.ලක්ෂ්මන් මයා | ගරු භාණ්ඩාගාරික | එම්.10/12 |
| 31. | ජී.එල්. හින්නි අප්පුහාමි මයා | ගරු භාණ්ඩාගාරික | එම්.9/11 |
| 32. | ඩී.පී.තිලක් ස්වර්ණ කුමාර මයා | ගරු භාණ්ඩාගාරික | යූ.බී.13,14,15 |
| 33. | ජී. අනූෂා සෝමවීර මිය | ගරු ලේකම් | එල්.බී.01ඒ බ:දු: |
| 34. | එල්.එන්.එස්.රූපසිංහ මයා | ගරු සභාපති | යූ.බී.13,14,15 |
| 35. | ඩබ්ලිව්.ගාමිණී කුමාරසිරි මයා | ගරු සභාපති | එල්.බී.16 |
| 36.. | රංජිත් විජේතුංග මයා | ගරු සභාපති | යූ.බී.07 |
| 37. | එන්.ජී.අමරරත්න මයා | ගරු සභාපති | එල්.බී.29,30,31,32 ජී. 01 |
| 38. | උපාලි බංඩාර මයා | ගරු භාණ්ඩාගාරික | එල්.බී.7 පහළ |
| 39. | ශාන්ත රංදෙනිය මයා | ගරු භාණ්ඩාගාරික | යාය 04 |
| 40. | එම්.ජී.උපුල් සේනාරත්න මයා | ගරු සභාපති | එම්. 5 ඒ |
| 41. | කේ.කේ.ලාල් හරිචන්ද්‍ර මයා | ගරු භාණ්ඩාගාරික | එල්.බී.27 ජී 02 |
| 42. | එච්.ඒ.පියදාස මයා | ගරු සභාපති | එල්.බී.27 ජී 02 |
| 43. | කේ.එල්.ඩී.ජයතිස්ස මයා | ගරු භාණ්ඩාගාරික | එල්.බී.04 |
| 44. | ආර්.ආර්.එම්.සරත් මයා | ගරු ලේකම් | එල්.බී.04 |
| 45. | ජී.ආර්. විජේරත්න මයා | ගරු සභාපති | එම්. 10/12 |
| 46. | කේ.ඩබ්ලිව්. සීතා ජයලත් මිය | ගරු ලේකම් | එල්.බී.7 පහළ |
| 47. | බී.ඒ.මුතුබංඩා මයා | ගරු ලේකම් | ජී.10 |
| 48. | ඩී.කේ.එම්.ගුණසේකර මයා | ගරු සභාපති | එල්.බී.15 |
| 49. | කේ.එම්.නිමල් ගුණසේකර මයා | ගරු සභාපති | එල්.බී.8 |
| 50. | සී.එච්.කුමාර මයා | ගරු සභාපති | යූ.බී.12 |

| | | | |
|---|---|---|---|
| 51. | සෙනරත් ධර්මරත්න මයා | ගරු සභාපති | එල්.බී.07 පහල |
| 52. | එම්.පී.දයාරත්න මයා | ගරු භාණ්ඩාගාරික | යූ.බී.07 |

න්‍යාය පත්‍රයට අනුව ආගම සිහි කිරිමෙන් අනතුරුව ව්‍යාපාර ගොවි සංවිධානයේ ගරු සභාපති සී.එච්. කුමාර මහතා විසින් පැමිණ සිටි රජයේ නිළධාරින් හා ගොවි නියෝජිත මහත්ම මහත්මීන් සාදරයෙන් පිළිගැනීමෙන් අනතුරුව, රැස්වීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා මුලාසනය ගල්ඔය වම් ඉවුර නේවාසික ව්‍යාපෘති කළමණාකාරු ඊ. ක්‍රිස්ටි දේශප්‍රිය මහතාට භාර දෙන ලදි.

**ආයතන සංවර්ධන කටයුතු**

**නේවාසික ව්‍යාපෘති කළමණාකාරු - ඊ. ක්‍රිස්ටි දේශප්‍රිය මහතා**

පසුගිය අප්‍රේල් මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්විම ආරක්ෂක හේතුන් මත පවත්වන්නට නොහැකි වු බවත්, එම නිසා මැයි මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම කලින්ම පැවැත්වීමට තීරණය කල බවත් පැවසීය.

**ගොවි සංවිධාන ගිණුම් විගණනය -** මේ වන විට ගොවි සංවිධාන 64 න් **34** ක 2018 වර්ෂයට අදාල ගිණුම් විගණනය කර අවසන් බවත්, තවත් ගොවි සංවිධාන කිහිපයක ගිණුම් පොත් විගණනය සඳහා භාර දී ඇති බවත්, පහත සඳහන් ගොවි සංවිධාන මෙතෙක් විගණනය සඳහා පොත් භාර දී නොමැති බවත් හැකි ඉක්මණින් විගණනය සඳහා පොත් භාරදෙන ලෙසත් ඉල්ලීය.

| | | | |
|---|---|---|---|
| එල් බී 10 | එල් බී 12 | එම 17/20 | ජී 05 |
| එල් බී 11 | එල් බී 14 | බුද්ධංගල | එල්.බී.34/35/36 |
| එල් බී 11 ඒ බී | එම 6/7 | ජී 4/7 | එල්.බී.37/38/39 |
| කුමුදුගම | | | |

**වාරිමාර්ග කටයුතු**

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු - අම්පාර**

මේ වන විට සේනානායක සමුද්‍රයේ ජල ධාරිතාවය අක්කර අඩි 186000 ක් බවත්,එය උසින් අඩි 66.5 ක් බවත්, වර්ෂාව බලාපොරොත්තුවෙන් 2019 යල කන්නය ආරම්භ කළත්, වර්ෂාව නොලැබීම නිසා දැඩි වියලි කාළගුණයක් පවතින බවත්, මැයි මාසයේ ද නැගෙනහිර පලාතට වර්ෂාව නොලැබෙන බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනාවැකි පල කර තිබෙන බවත් පැවසීය.

එසේම කන්නය ආරම්භයේදි අක්කර අඩි 27000 ක අවම ජල පරිමාවක් වැවට ලැබේ යැයි බලාපොරොත්තුවෙන් කන්නය ආරම්භ කළද, මෙතෙක් ජලය අක්කර අඩි එකක්වත් නොලැබුන බවත්, මේ තත්වය මත ඉදිරියේදී ජල ගැටළුවකට මුහුන දිය හැකි බවත්, එම නිසා ජලය අපතේ නොයවා ප්‍රවේසමින් ජලය පරිහරනය කරන ලෙසත් ඉල්ලීය.

තවද පසු ගිය දිනක වැටුනු වර්ෂාව ඇල වැසූ බවත්, ඒ හේතුවෙන් ජල මුර ක්‍රමය අක්‍රමවත් වු බවත්, ආරක්ෂක හේතුන් මත පසුගිය මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි වීම නිසා ගොවි සංවිධාන දැණුවත් කිරීමට මාර්ගයක් නොවූ

බැවින් අක්‍රමවත් වූ ජල මුර ක්‍රමය නැවත සකස් කර ගත නොහැකි වූ බවත් පැවසීය. ඒ අනුව අද දින සාකච්ඡා කර ජල මුර කාල සටහනක් සකසා ගත යුතු බවත් වැඩිදුරටත් පැවසීය.

එසේම මෙම දිනවල ඇළවල්වල මෙහෙයුම් නඩත්තු වැඩ සිදු කෙරෙන බවත් ජනාධිපතිතුමාගේ " එක්ව නැගිටිමු" වැඩසටහන යටතේ උහන ප්‍රදේශයේ වැඩ කොටස් කිහිපයක් සිදු කරන බව ද පැවසීය.

**ඉංජිනේරු සහකාර - එන්.ටී. ආර්. ජයවීර මහතා -උහන/අන්නමලේ**

මැයි 07 දින වන විටත් වී වපුරන අය සිටි බවත්, එවැනි ගොවි මහතුන් පිළිබඳව හා අගාවත වගා නොකළ යුතුයැයි නියම කළ කොටස් වල වගා කළ අය සම්බන්ධයෙන්ද වගකීමක් නොමැති බව පැවසීය.

මෙවර මුර ක්‍රමය සැළසුම් කිරිමේදි එක යායකට දින 05 ක් ජලය ලබා දිමටත් දින 07 ක් වසා තැබීමටත් තිරණය කළ බව පැවසීය. මෙම දවස් 05 ඇතුලත එම යායේ සියලුම ගොවි මහතුන් වතුර බෙදා ගැනීම කළ යුතු බවත්, මෙවර ප්‍රධාන ඇල වැසීමක් සිදු නොකරන අතර බෙදුම් ඇලවල පමණක් ජලය මුර ක්‍රමයට ලබා දෙන බව පැවසීය.

**ගරු භාණ්ඩාගාරික - එල්.බී. 07 පහළ බෙදුම් ඇල ගොවි සංවිධානය**

කොටවෙහෙර යායේ මාසයක් පමණ වයසැති ගොයම් ඇති බවත්, මේ වන විට ඇල වසා ඇති බවත්, ඉක්මණින් ජල මුරය අවශ්‍ය බවත් පැවසීය.

**ඉංජිනේරු සහකාර - එන්.ටී. ආර්. ජයවීර මහතා -උහන/අන්නමලේ**

අම්පාර ඒකකයේ ඉංජිනේරු සහකාර මහතා සමග සාකච්ඡා කර වතුර ලබා ගන්නා ලෙස පැවසීය.

**ගරු සභාපති - යූ.බී. 3.4.5.6 බෙදුම් ඇල ගොවි සංවිධානය**

මැයි 10 වන දින වතුර ලබා දෙන ලෙස ඉල්ලිය.

**ඉංජිනේරු සහකාර - එන්.ටී. ආර්. ජයවීර මහතා -උහන/අන්නමලේ**

පසුගිය වර්ෂාවත් සමග ජලාශයෙන් නිකුත් කරන ජලය අඩු කර යම් ජල ප්‍රමාණයක් ඉතිරි කර ගත් බව පැවසීය.

**ගරු සභාපති - යූ.බී 13,14,15 බෙදුම් ඇල ගොවි සංවිධානය**

ඇලවල් අරින, වහන වේලාවල් පිළිබඳව පත්‍රිකා ටිකක් සකස් කර ප්‍රදර්ශණය කිරිමට කටයුතු කරන ලෙස පැවසීය.

**ගරු සභාපති - යූ.බී. 09 බෙදුම් ඇල ගොවි සංවිධානය**

කන්න තිරණ අනුව ගොඩට වැපිරිම නිසා වල් ගහනය වැඩි වූ බවත්, මේ වන විට වල් මර්ධනය කර ගැනිමට අපහසු තත්වයක් පවතින බවත්, කන්නය පමා වූ අයටද වතුරින් ගැටළුවක් වී නැති බවද පැවසීය.

**ඉංජිනේරු සහකාර - එන්.ටී. ආර්. ජයවීර මහතා -උහන/අන්නමලේ**

කන්න තීරණ වලට එකග නොවී වැඩ කල ගොවි මහත්ම මහත්මීන්ට පසුකාලීනව අයහපත් ප්‍රතිඵල ලැබේවි යැයි පැවසූ අතර, අක්කර 30000 ක් දෙස බලා අනෙක් ප්‍ර දේශවල තිබෙන අක්කර 90000 ක් දෙස නොබලා කටයුතු කිරිමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිළධාරින්ට කළ නොහැකි බව පැවසීය.

**ගරු භාණ්ඩාගාරික - යාය 04 බෙදුම් ඇල ගොවි සංවිධානය**

කොම්බුසන්දි යායට හා නේත්‍රාවිල් යායට වතුර වැදි නොමැති බවත්, රාටියාර් යායේ වතුර පහළට යන දොර ද ඇර නොමැති බවත් පැවසීය.

**ඉංජිනේරු සහකාර - ජේ.ඒ.ඩී.එස් සේනාරත්න - අම්පාර ඒකකය**

වතුර ප්‍රමාණවත් බවට තමන් වෙත පණිවිඩයක් ලැබුණු බැවින් ඇල වසා දැමූ බවත්, ජලය අවශ්‍යනම් විවෘත කර දිය හැකි බවත් පැවසීය.

**ගරු සභාපති - එල්.බී. 20 බෙදුම් ඇල ගොවි සංවිධානය**

එල්.බී. 20 ඇලේ රොන්මඩ ඉවත් කර ගැනීමට මැෂින් එකක් ලබා දෙන ලෙස ඉල්ලීය.

**ඉංජිනේරු සහකාර - ආර්.එම්.එස්. රත්නායක මහතා - ගොනාගොල්ල**

එල් බී 20 ඇල ප්‍රතිසංස්කරණය සඳහා මේ වන විටත් මුදල් ලැබී ඇති බැවින්, ප්‍රතිසංස්කරණය අවස්ථාවේ ඇලේ රොන් මඩ ඉවත් කරන බව පැවසීය.

**ගරු සභාපති - යූ.බී. 07 බෙදුම් ඇල ගොවි සංවිධානය**

යූ.බී. 07 ඇලේ පැති බැම්මක් කැඩී ඇති බවත් සකස් කර දෙන ලෙසත් ඉල්ලීය.

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු - අම්පාර**

ඊලග වර්ෂයේදී සකස් කිරිමට යෝජනාවක් ඉදිරිපත් කරමුයි පැවසීය.

අනතුරුව ඉංජිනේරු සහකාර මහතුන් ඒ ඒ ඒකක සඳහා සකස් කරන ලද ජල කාලසටහන් උහන ඒකකය භාර ඉංජිනේරු සහකාර මහතා විසින් සභාවට ඉදිරිපත් කළේය.

**ඉංජිනේරු සහකාර - එන්.ටී. ආර්. ජයවීර මහතා -උහන/අන්නමලේ**

මුර ක්‍රමය යටතේ ඒ ඒ ඒකක වලට වතුර ලබා දෙන ආකාරය පහත සඳහන් පරිදි වන බව පැවසීය.

| අ:අ: | වාරිමාර්ග ඒකකය | බෙදුම් ඇලවල් වලට ජලය නිකුත් කරන දිනය | බෙදුම් ඇල වසන දිනය |
|---|---|---|---|
| 01. | අම්පාර | මැයි 18 | මැයි 11 |

| | | | |
|---|---|---|---|
| 02. | උහන | මැයි 12 | මැයි 17 |
| 03. | වීරගොඩ | මැයි 18 | මැයි 11 |
| 04. | ගොනාගොල්ල | මැයි 18 | මැයි 11 |
| 05. | අන්නමලේ | මැයි 12 | වසා ඇත |

ඒ අනුව ජල මුර අතර තුර මුළු ප්‍රදේශයම ආවරනය වන පරිදි ප්‍රමාණවත් වර්ෂාවක් ලද හොත් සේනානායක සමුද්‍රයෙන් ප්‍රධාන ඇල වසන අතර නැවත මුර ක්‍රමය ආරම්භ වන දිනය වාරිමාර්ග ඒකක කාර්යාල වලින් විමසා දැන ගන්නා ලෙස ගොවි නියෝජිත වරුන්ගෙන් ඉල්ලා සිටියේය.

**කෘෂිකර්ම කටයුතු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිළධාරීන්ගේ වෘතිය සමිති ක්‍රියාමර්ගයක් හේතුවෙන් කිසිවකු රැස්වීමට පැමිණ නැත.

**ගොවිජන සේවා කටයුතු**

**ගරු සභාපති - එල්.බී. 20 බෙදුම් ඇල ගොවි සංවිධානය**

වලගම්පුරට පොහොර දිමට මුදල් ලැබි නොමැති බව පැවසීය.

**ගරු සභාපති - යූ.බී. 9 බෙදුම් ඇල ගොවි සංවිධානය**

පසුගිය කන්නයේ වගා හානි වෙනුවෙන් රක්ෂණ වන්දි නොලැබුන බවත්, ව්‍යාපාර කළමණාකාරන කමිටු රැස්වීම් කිහිපයක මේ සම්බන්දයෙන කතා කළද එම ගැටළුව වාර්තාගත නොවූ බවත්, අදටත් ඒ සඳහා විසඳුමක් ලැබි නොමැති බවත් පැවසීය. මෙවර කන්නයේ වු ජල හිගය හේතුවෙන් අඩු දින ගණනකින් වපුරා අවසන් කිරිමට කන්න රැස්වීමේදී තිරණ ගැනිමට සිදු වු බැවින් අම්පාර ගල්ඔය ව්‍යාපාරයේ ගොවින්ට අවුරුදුත් නොමැති වු බව පැවසීය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු - ඊ ක්‍රිස්ටි දේශප්‍රිය මහතා**

යූ.බී. 9 බෙදුම් ඇල ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමාගේ රක්ෂණ වන්දි ලබා ගැනිමට ඉදිරිපත් කල අයදුම්පතේ සිදු වී තිබූ වරදක් හේතුවෙන් එය මුලදී ප්‍රතික්ශේප වී පසුව එය නිවරදි කර ඉදිරිපත් කර ඇති බවත්, ඉදිරියේදී වන්දි ලැබිය හැකි බවට කෘෂි රක්ෂණ නිළධාරීන් පැවසූ බව දැන්වීය.

**ව්‍යාපාර ගොවි සංවිධානයේ ගරු සභාපති - සී.එච්.කුමාර මහතා**

වැවේ තිබෙන වතුර ප්‍රමාණයෙන් වගා කළ හැක්කේ අක්කර 60000 ක් බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව පැවසූ බවත්, ඉන්පසු වගා නොකරන ගොවින්ට මොනවාද දෙන්නේ යන ප්‍රශ්ණය නැගූ නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හෝ දිසාපතිතුමාට මේ සඳහා උත්තරයක් නොමැති වූ බවත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මේ සඳහා උත්තර දිය නොහැකි බව ද පැවසීය.

පසුව තිබෙන වතුර ප්‍රමාණය නිකුත් කරන්නනම් තිබෙන ජලයෙන් වගා කළ හැකි භූමි ප්‍රමාණය පමණක් වගා කරමුයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව යෝජනා කළ නමුත්, පැවති හා පවතින තත්වයන් මත තීරණයක් ගත්තද, පවතින දැඩි නියඟය නිසා අද වන විට මුහුණ දී ඇති තත්වය අනුව ගොවි මහතුන් එකතු වී කටයුතු නොකළ හොත් මීට වඩා අවධානමකට මුහුණ දීමට සිදු වන බව පැවසීය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු** - අද දින Oxfam ආයතනය විසින් වාරි කර්මාන්තය තුල තොරතුරු සංනිවේදන තාක්ෂණය, නියඟයට ඔරොත්තු දෙන කෘෂි ව්‍යවසාය ගොඩ නැගීම, කාලගුණ දත්ත මත පදනම් වූ රක්ෂණ ක්‍රමය පිළිබඳ ගොවි නියෝජිතයින්ක් දැණුවත් කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙස තමාගෙන් ඉල්ලු බවත්, ඒ සඳහා අවස්ථාව අද දින ව්‍යාපාර කළමණාකරන කමිටු රුස්වීමේදි ලබා දෙන බවත් පවසමින් Oxfam ආයතනයට ඔවුන්ගේ වැඩසටහන කර ගෙන යාමට අවස්ථාව ලබා දෙන ලදි.

**කළමණාකරු - සණස රක්ෂණ සමාගම**

මෙම වැඩසටහන ක්ෂේත්‍රයට අලුත් වැඩසටහනක් බවත්, ත්‍රිකුණාමලය, මහඔය වැනි ප්‍රදේශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ බවත් සාමාන්‍ය යෙන් වගා රක්ෂණයකදී මුදලක් ලබා ගෙන රක්ෂණයක් ක්‍රියාත්මක වන නමුත්, මෙම රක්ෂණ ක්‍රමයේදි අඩු වර්ෂාව හා වැඩි වර්ෂාව පදනම් කර ගෙන ක්‍රියාත්මක වන වන රක්ෂණයක් බවත් පැවසූ අතර දීර්ග පැහැදිලි කීරීමක් කළේය. ඒ අනුව මෙම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරිමට කැමති ගොවි සංවිධාන සිටි නම් පහත දුරකථන අංකයට අමතා විස්තර ලබා ගත හැකි බව පැවසීය. දුරකථන අංකය 077-2294131

**ස්තුති කතාව - ව්‍යපාර ගොවි සංවිධානයේ ගරු ලේකම්**

අද දින රැස්විමේ සාකච්ජා කළ කරුණු සාර්ථක කර ගැනීමට කටයුතු කරමුයි පවසමින් රැස්විමට පැමිණි රජයේ නිළධාරින්ටත්, oxfam ආයතනයේ සියලුම නිළධාරින්ටත්, සණස රක්ෂණ සමාගමේ කළමණාකාර මහතාටත්, පැමිණි ගොවි නියෝජිත මහත්ම මහත්මීන්ටත් ස්තුතිය පුද කරමින් ප.ව. 1.45 ට පමණ රැස්විමේ කටයුතු අවසන් කරන ලදි.



සකස් කළේ:-

කේ.එස්.කේ. හේරත්
සංවර්ධන සහකාර
ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය

ඊ. ක්‍රිස්ටි දේශප්‍රිය
නේවාසික ව්‍යාපෘති කළමණාකරු
ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරය